*සැ. යු.*– මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2001 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ජනවාරි, මාර්තු කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,484 - 2007 පෙබරවාරි 09 වැනි සිකුරාදා - 2007.02.09**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 86 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 87 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | — |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 87 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 පෙබරවාරි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 46

ඩීවීඑල්/ආර්ර්සීටී/30/ඒවයි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

පහත නම සඳහන් ජොෂ්ඨ නිලධාරීන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ලුතිනන් කර්නල් නිලයෙහි ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :–

නි/2161 ලුතිනන් කර්නල් (තාවකාලික ලුතිනන් කර්නල්) ප්‍රසාද් අශෝක ගාර්දිය පුංචිහේවා ශ්‍රීලංඝ 2006.05.01
නි/2329 ලුතිනන් කර්නල් (තාවකාලික ලුතිනන් කර්නල්) බන්දුගොඩගේ සුනිල් ගාමිනී නානායක්කාර ශ්‍රීලයුයුබ - 2006.07.01
නි/2258 ලුතිනන් කර්නල් (තාවකාලික ලුතිනන් කර්නල්) ඩවුන්දසේකර මුදියන්සේලගේ ගාමිනී බණ්ඩාර ඇලිකේවෙල ශ්‍රීලංඝ 2006.08.01
නි/2373 ලුතිනන් කර්නල් (තාවකාලික ලුතිනන් කර්නල්) මහින්දසිරි මහින්දලාල් කුළතුංග ශ්‍රීලපාහ 2006.09.01
නි/2401 ලුතිනන් කර්නල් (තාවකාලික ලුතිනන් කර්නල්) ගැමුණු කුමාර බණ්ඩාර දිසානායක විපාරෙ - 2006.09.01

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

02-287

---

2007 අංක 47

ඩීවීඑල්/ආර්ර්සීටී/264ඒවයි.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් මරණයෙන් පසු අනුමත කරන ලද නිල උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 අගෝස්තු මස 11 වන දින සිට මේජර් නිලයට මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :–

කපිතන් උඩුගම සූරියගේ දොන් වික්‍රමරත්න විපාරෙ (නි/5454)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

02-285

---

2007 අංක 48

ඩීවීඑෆ්ජ්/ආර්ර්සීටී/261.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 මාර්තු මස 02 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :–

නි/5137 ලුතිනන් වීරසිංහ මුදියන්සේලාගේ උඩුතුරේ ගෙදර සුමිත් වීරසිංහ ගැහේබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

02-284

---

ඩීවීඑල්/ආර්ර්සීටී/260.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් අපකීර්ති සහගතව ඉවත් කිරීම

පහත නම සඳහන් නිලධාරී 2005 මාර්තු මස 31 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ අධිකාරියෙන් අපකීර්ති සහගතව ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :–

දෙවන ලුතිනන් සිරිසේනගේ ගුනපාල ගරෙ (නි/5396)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2006 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-286

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 49

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

මේජර් ජනරාල් ටී. ටී. ආර්. ද සිල්වා මහතා 2006 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් වශයෙන්.

02-201

2007 අංක 50

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :–

ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයෙන් විශ්‍රාමලත් රියර් අද්මිරාල් එස්. ජී. වීරසේකර ආර්ඩබ්ලිව්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී 2006 නොවැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එක් (01) වර්ෂයක කාලයක් සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

02-200

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා යෝජනා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0069 5000 1478-ඒ පී. යූ. චිත්‍රානන්ද.

2006 ඔක්තෝබර් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුනු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හෝමාගම, ගොඩගම, 1වන පටුමඟ අංක 120/3ඩී හි පදිංචි අඹන්පිටි පතිරණලාගේ උපාලි චිත්‍රානන්ද යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 සැප්තැම්බර් මස 29 දාතම හා අංක 1083 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2006 අගෝස්තු මස 24 දිනට රුපියල් දහසය ලක්ෂ විසිනව දහස් අටසිය දොළහකුත් ශත පනස්තුනක් (රු. 16,29,812.53) ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දහසය ලක්ෂ විසිනව දහස් අටසිය දොළහකුත් ශත පනස් තුනක (රු. 16,29,812.53) සම්පූර්ණ හිඟ මුදල සමඟ තවත් රුපියල් දාහතර ලක්ෂ අනූහතර දහස් පන්සිය හැත්තෑ එකකුත් ශත තිහක (රු. 14,94,571.30) මුදල සඳහා වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2006 අගෝස්තු මස 25 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 1083 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම පිහිටි ගැමුණු මාවතේ, වරිපනම් අංක 83, 87 සහ 89 දරන බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 2003 ජූලි මස 01 දාතම හා අංක 3645 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ ජී1126/265හි ලියාපදිංචි කොට ඇති උතුරට : පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. ඩී. එදිරිවික්‍රම විසින් සාදන ලද අංක 375 පිඹුරේ ලොට් 2හි කොටසක් ද, දකුණට : එකී අංක 375 පිඹුරේ ලොට් 2හි කොටසක් ද සහ බස්නාහිරට : ගැමුණු මාවත ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා සියළු දේ සමඟ සහ එයට අදාල වන සියළුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන, දාසත්ව හා සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

02-347/1

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0104401512.

ණයකරුගේ සම්පූර්ණ නම : මහානාම ගමගේ නිමල් කීර්ති කුමාර මහානාම.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ටී. ඩී. කරුණාරත්න විසින් ලියා සහතික කරන ලද අංක 203 හා 2002.03.10 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දාසයලක්ෂ අනූහතරදහස් එකසිය අසූතුනයි ශත තිහක (රු. 16,94,183.30) ක මුදලක් වර්ෂ 2005.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දාහතරලක්ෂ දොළොස්දහස් දෙසීය තිස්හතරයි ශත අනූතුනක (රු. 14,12,234.93) මුදල ද වර්ෂ 2005.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ අසූඑක්දහස් නමසිය හතලිස් අටයි ශත තිස්හතක් (රු. 2,81,948.37) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දාසයලක්ෂ අනූහතරදහස් එකසිය අසූතුනයි ශත තිහක (රු. 1,694,183.30) ද,

(2) එකී රුපියල් දාහතරලක්ෂ දොළොස්දහස් දෙසීය තිස්හතරයි ශත අනූතුනක (රු. 14,12,234.93) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2005.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005ක් වූ අගෝස්තු මස 11 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, සියනෑ කෝරළේ, කොස්සින්න ග්‍රාමයෙහි හි පිහිටි හල්ගහවත්ත නමැති ඉඩමට 1999.09.29 වැනි දින එස්. බී. ජයසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 10539 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, ඊසානට : ප්‍රධාන පාර ද, ගිණිකොණට : කැබලි අංක 3 ද, නිරිතට : කැබලි අංක 2 ද, වයඹට : එම්. ටී. ඇලෙක්සැන්ඩර්ගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්හයයි දශම අටක (අ. 0, රු. 0, පර්. 36.8) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E577/236හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-324

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2006.01.18 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :–

1. හම්බන්තොට මහජන නොතාරිස් එම්. කේ. එම්. එම්. මහ්සුම් මහතා සහ කොළඹ මහජන නොතාරිස් සී. කේ. අයි. පී. ඒ. මුදලිගේ මහත්මිය යන අය විසින් පිළිවෙළින් සහතික කරන ලද 1987.11.13 සහ 1996.01.24 දිනැති අංක 2261 සහ 217 දරන බැඳුම්කර මත මුල් මුදල හා 2004.09.30 දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිහතර ලක්ෂ අසූහයදහස් හාරසිය හතරයි ශත විසිපහක (රු. 24,86,404.25) මුදලක් සමඟ රුපියල් දෙලක්ෂ අනූනව දහස් හාරසිය පහක (රු. 2,99,405), රුපියල් දෙලක්ෂ තිස්දෙදහස් හාරසිය පහක (රු. 2,32,405) සහ රුපියල් පන්ලක්ෂ හැටඅටදහස් හාරසිය හයයි ශත හතලිස් හයක (රු. 5,68,406.46) මුදලක් මත පිළිවෙලින් වසරකට සියයට විසිපහයි දශම පහ (25.5%) සහ සියයට විසිහයයි දශම පහ (26.5%) බැගින් පොලියක්, 2004.10.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් අම්බලන්තොට, තවලුවිල, තංගල්ල පාර "ජයගිරි" හි පදිංචි පුන්සිරි අබේදීර ජයවික්‍රම මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2261, 217 දරන බැඳුම්කර මත අයවිය යුතු රුපියල් පන්ලක්ෂ දොළොස් දහස් හයසිය එකක් (රු. 5,12,601), රුපියල් හයලක්ෂ හැට එක් දහස් පන්සිය අසූඅටක (රු. 6,61,588) සහ රුපියල් දහතුන් ලක්ෂ දොලොස් දහස් දෙසීය පහළොවයි ශත විසිපහක (රු. 13,12,215.25) මුදල සමඟ 2004.10.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55ඒහි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ අම්බලන්තොට ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවාපත්තු නැගෙනහිර හි තවලුවිල හි පිහිටියාවූ ද, ටී. පී. 318630හි ලොට් අංක 105ඒ දරන වෙහෙරයාය මලිත්තන්ගහවත්ත හෙවත් තණලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. විජේසේකර විසින් සාදන ලද 1975 අගෝස්තු මස 18 දිනැති අංක 938 දරන මිණුම් පිඹුරේ විස්තර කළ ලොට් 4 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල, උතුරට : මහා මාර්ගය ද, නැගෙනහිරට : දහනායකගේ මැණික් අප්පුට අයිති ලොට් 95 ද, දකුණට : ඩූල් මුදලියාර්ට අයිති ටී. පී. 313501හි ලොට් 95 ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 3 ද මායිම්ව එකී අංක 938 දරන පිඹුර අනුව පර්චස් තිස්පහයි දශම එකක (අ. 0, රු. 0, පර්. 35.1) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි ගොඩනැගිලි ද වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොට්ඨාස ඩී, වෙළුම 21 පත්ඉරු 13හි ලියාපදිංචි කර ඇත.

එකී තවලුවිල හි පිහිටියාවූ ද ටී. පී. 318630හි ලොට් අංක 105ඒ දරන වෙහෙරයාය මලිත්තන්ගහවත්ත හෙවත් තණලන්ද නමැති ඉඩම 1975 අගෝස්තු මස 18 දිනැති අංක 938 දරන පිඹුරේ ලොට් 5 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : එම ඉඩමේම ලොට් 1 ද, නැගෙනහිරට සහ දකුණට : ඩූල් මුදලියාර්ට අයිති ටී. පී. 313501හි ලොට් 95 ද, බස්නාහිරට : ලොට් 105බී දැන් පාර ද මායිම්ව එකී අංක 938 දරන පිඹුර අනුව, පර්චස් එකයි දශම හයක (අ. 0, රු. 0, පර්. 1.6) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොට්ඨාස ඩී, වෙළුම 21 පත්ඉරු 14හි ලියාපදිංචි කර ඇත.

එම්. ඒ. ගමගේ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
අම්බලන්තොට.

02-313

## සීමාසහිත සෙලාන් බැංකුව-සරික්කමුල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0400-03533910-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004 ජනවාරි මස 23 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. ෆොන්සේකා විසින් සහතික කරන ලද 1998 සැප්තැම්බර් මස 10 දිනැති අංක 3156 සහ 1999 ඔක්තෝබර් මස 19 දිනැති අංක 3307 සහ ප්‍රසිද්ධ නොතාරිස් ටී. පී. කරුණාසේකර විසින් සහතික කරන ලද 2000 සැප්තැම්බර් මස 01 දිනැති අංක 386 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම මොරටුව පදිංචි හිබ්බතුල් කරීම් හන්සිතුල් ෆිලුල් සහ මොහමඩ් සිද්දීක් ෂාමිලා හන්සතුල් ෆිලුල් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහහතරලක්ෂ තුන්දහස් හත්සිය පනස්හතයි ශත දහහතරක් (රු. 14,03,757.14) මුදලක්, 2003 ජූලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 14,03,757.14 මුදල ද, 2003 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි අට (28%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3156, 3307 සහ 386 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය සභාව තුළ කදුරුදූව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1992.01.17 දිනැති අංක 2706 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පිටියතොටේ ඕවිට සහ පිටියතොටේ කුරුඳුවත්ත නමැති ඉඩමේ ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමේ කැබලි අංක 2 ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : මාටින්ගේ ඉඩම ද, නැගෙනහිරට : කැබැලි අංක 1 සහ මාටින්ගේ ඉඩම ද, දකුණට : කැබැලි අංක 29(අඩි 30ක් පළල පාරක් සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : කැබැලි අංක 3 යන මායිම් තුළ අංක 2706 දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.5) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව එෆ් 340/136හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් කැබලි තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ එයට අදාල අනිකුත් පොදු අයිතීන් සමඟ.

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර, පානදුර ප්‍රාදේශීය සභාව තුළ කදුරුදූව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1992.01.17 දිනැති අංක 2706 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පිටියතොටේ ඕවිට සහ පිටියතොටේ කුරුඳුවත්ත නැමති ඉඩමේ කැබලි අංක 13 (අඩි 30ක් පළල පාරක් සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කල සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : කැබැලි අංක 11, 14 සහ 34 ද, නැගෙනහිරට : කැබැලි අංක 7, 8, 9, 10 සහ 11 ද, දකුණට : කැබැලි අංක 29 සහ බස්නාහිරට : කැබැලි අංක 14, 15, 19 සහ 33 ද යන මායිම් තුළ එකී අංක 2706 දරන සැලැස්ම අනුව පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව එෆ් 320/261හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්ද පනාදුර, පානදුර ප්‍රාදේශී සභාව තුළ කදුරුදූව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද 1992.01.17 දිනැති අංක 2706 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පිටියතොටේ ඕවිට සහ පිටියතොටේ කුරුඳුවත්ත නමැති ඉඩමේ කැබලි අංක 29 (අඩි 30ක් පළල පාරක් සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් උතුරට : කැබලි අංක 19. 13, 7, 4, 3, 2 සහ 1 ද, නැගෙනහිරට : කැබලි අංක 7, 6, 5, 4 සහ 1 ද, දකුණට : තිලක පාර වරිපනම් අංක 18 දරන ඒ. සමරසේකර යන අයගේ කදුරුගහඕවිට ඉඩම සහ බස්නාහිරට : කැබලි අංක 30, 28, 20 සහ 32 ද යන මායිම් තුළ එකී අංක 2706 දරන සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් අටක් (අ. 0, රූ. 1, පර්. 8) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව එෆ් 297/252හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති

02-340

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0100006667.

ණයකරුගේ සම්පූර්ණ නම : වැල්ලවත්තගේ ජගත් සිසිරසේන ද සිල්වා.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. වී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 1246 හා 2003.12.23 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පහළොස්ලක්ෂ හැටනවදහස් හාරසිය දාහතයි ශත දහයක (රු. 15,69,417.10) ක මුදලක් වර්ෂ 2006.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දාහතරලක්ෂ දහඅටදහස් හත්සිය විසිපහයි ශත හැටහතක (රු. 1,418,725.67) මුදල ද, වර්ෂ 2006.09.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ පනස්දහස් හයසිය අනූඑකයි ශත

හතලිස්තුනක් (රු. 1,50,691.43) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පහළොස්ලක්ෂ හැටනවදහස් හාරසිය දාහතයි ශත දහයක් (රු. 15,69,417.10) ද,

(2) එකී රුපියල් දාහතරලක්ෂ දහඅටදහස් හත්සිය විසිපහයි ශත හැටහතක (රු. 1,418,725.67) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.50% බැගින් වන පොළියක් 2006.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006ක් වූ ඔක්තෝබර් මස 26 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවේ, මාවිත්තර ග්‍රාමයෙහි පිහිටි මහගොඩ පරගහවත්ත නමැති ඉඩමට 2003.10.11 දින ඩබ්ලිව්. එම්. වීරකෝන් බණ්ඩා මානක තැන විසින් මැන සම්පාදිත අංක 817 පිඹුර ප්‍රකාර ලොට් 1ඒට මායිම්, උතුරට : පිළියන්දල සිට කොට්ටාව දක්වා වූ පාර ද, නැගෙනහිරට : ගීතා සෙනෙවිරත්නට සහ රංජනී ඇපාසිංහට අයත් දේපළ ද, දකුණට : කුමාරගේට අයත් අළුබෝගහවත්ත ද, බස්නාහිරට : අළුත්ගේ දෝන පියවතීට අයත් දේපළ ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතයි දශම හතරයි අටක (අ. 0, රූ. 0, පර්. 27.48) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමඟ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2721/196හි ලියාපදිංචි කර ඇත

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-323

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් : අංකය 0007 5010 0627.

2006 නොවැම්බර් මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දිගන, රජවැල්ලේ, අංක 154හි පදිංචි කෝරළේ වත්තේ ගෙදර ධම්මික නිශාන්ත සමරකෝන් යන අය බන්ධනදායී වශයෙන් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඒ. රත්නායක විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 ජුලි මස 15 දාතම හා අංක 19 දරන උකස් බැඳුම්කරය මත උකස් තබා පැවරුම් කළ මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට තබා ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින්, 2006 සැප්තැම්බර් මස 20 වැනි දිනට සීමාසහිත සම්පත් බැංකුවට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකොලොස් ලක්ෂ පනස් පන්දහසක් (රු. 1,155,000) වන එකී ණය පහසුකම් මත අයවීමට ඇති මුලු මුදල වශයෙන් අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එකොලොස් ලක්ෂ පනස් පන් දහසක් (රු. 1,155,000) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් අටලක්ෂයක (රු. 8,00,000) මුදල සඳහා වසරකට සියයට දාහතක (17%) පොලී මුදල සමඟ 2006 සැප්තැම්බර් මස 21 වැනි දින සිට වෙන්දේසි දින තෙත් තවදුරටත් පොලී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 19 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර කෝරළේ, උඩ ගම්පහ පත්තුවේ, කුන්ඩසාලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, අතරගල්ල සහ කෙන්ගල්ල ග්‍රාමයේ (එහෙත් අතරගල්ල සහ පල්ලේගම වශයෙන් ලියාපදිංචි කර ඇති) තෙල්දෙනිය පාර ඔස්සේ පිහිටි වරිපනම් අංක 327 දරන මල්පානවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන විසින් සාදන ලද 2005 අප්‍රේල් මස 02 දාතම හා අංක 5695 (බලයලත් මිනින්දෝරු ජයම්පති යටවර විසින් සාදන ලද 1969 මාර්තු 07 දාතම හා අංක 1048 දරන පිඹුරේ ලොට් 3 නමැති ඉඩම නැවත මනිනු ලැබ හා උපබෙදුම් කල බලයලත් මිනින්දෝරු සී. ඩී. ආදිහෙට්ටි විසින් සාදන ලද 2004 ජුනි 29 දාතම හා අංක 1048/X දරන පිඹුරේ ලොට් 3B1A සහ 3B1B වශයෙන් ද, නිරූපිත) පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට නිරූපිත මහනුවර ඉඩම් කච්චේරියේ වෙළුම/පත්ඉරුව E777/134 යටතේ ලියාපදිංචි කොට ඇති උතුරට : මැණික් හින්නේ සිට දිගනට යන පාරෙන් ප්‍රධාන මාර්ගය වෙන් කරන ජීවී වැට ද, 1048/X පිඹුරේ ලොට් 3B2 ද සහ අංක 1048 පිඹුරේ ලොට් 3C ද, නැගෙනහිරට : පන්සල් භූමිය සහ නිවාස වල සිට ප්‍රධාන මාර්ගය දක්වා අඩි පාර ද, දකුණට : අංක 1048 පිඹුරේ ලොට් 04 ද සහ බටහිරට : අංක 1048 පිඹුරේ ලොට් 3A වෙන් කරන ජීවි වැට ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් දෙකක් (අ. 0, රූ. 2, පර්. 2) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කල බිම් කොටස එහි පිහිටි ගසකාළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ සමග සහ එයට අදාල අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන දාසත්ව සියල්ල සමඟය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

02-347/2

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0007 1001 4329.

2006 ජුලි මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහනුවර, කොටුගොඩැල්ල වීදියේ, අංක 03 දරන ස්ථානයේ ඩී. ජයවික්‍රම සහෝදරයෝ යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ එකම අයිතිකරු වශයෙන් ව්‍යාපරික කටයුතු කරගෙන යන මහනුවර, අත්තිවත්ත, රිවඩේල් පාරේ, අංක 69හි පදිංචි වසන්ත ජයවික්‍රම යන අය බන්ධනදායී වශයෙන් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. විබැද්ද විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2004 ජූලි මස 28 දාතම හා අංක 426 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2005 ඔක්තෝබර් මස 22 වැනි දිනට රුපියල් දහතුන් ලක්ෂ අසූඑක් දහසක (රු.1,381,000) මුදලක් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දහතුන් ලක්ෂ අසූඑක් දහසක (රු. 1,381,000) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් අටලක්ෂ හැට දහසක (රු. 8,60,000) මුදල සඳහා වසරකට සියයට දාහතයි දශම පහ (17.5%) බැගින් ද තවත් රුපියල් හාරලක්ෂ දහසය දාහක (රු. 4,16,000) මුදල සඳහා වසරකට සියයට දාහත (17%) බැගින් ද 2005 ඔක්තෝබර් මස 23 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අය කර ගැනීම සඳහා එකී අංක 426 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ, මහනුවර මහනගර සභා සීමාව ඇතුළත නාගරික කොට්ඨාස අංක 05, නුවර-දොඩංවල තුළ නුවර දොඩංවල පිහිටි මහකුඹුර නමැති සහ ගිරඹෙවත්ත කොටසක් වන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඉසෙඩ් ආබ්දීන් විසින් සාදන ලද 2004 අප්‍රේල් 26 දාතම හා අංක 400/1566/EL028 දරන සාවයව පිඹුරේ ලොට් A (බලයලත් මිනින්දෝරු එම්. ඉසෙඩ් ආබ්දීන් විසින් සාදන ලද අංක 1566 දරන පිඹුරේ ලොට් 1 වන) වශයෙන් නිරූපිත උතුරට : ජීවී වැට ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : ලොට් B ද සහ බටහිරට : දොඩංවල පාර (පැසේජය) ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 1.3) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පිහිටි සෑම සියළු දේ සමග ය. එකී ලොට් A බිම් කොටස මතු දැක්වෙන ඉඩමේ ප්‍රතිමිනුමකි. ඒ කෙසේද යත්

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව ඇතුළත නුවර-දොඩංවල පිහිටි මහකුඹුර නමැති හා ගිරඹෙවත්ත ඉඩමේ කොටසක් වන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඉසෙඩ් ආබ්දීන් විසින් සාදන ලද 2003 ජූලි 06 දාතම හා අංක 1566 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රුරුව A348129හි ලියාපදිංචි කොට ඇති උතුරට : එච්. එම්. පුංචි මැණිකේ අයිතිය කියන ගිරඹෙවත්ත ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : අංක ELO28 පිඹුරේ ලොට් 3හි ඉතිරි කොටස ද සහ බටහිරට : දොඩංවල පාර (පැසේජය) ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 1.3) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ය.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව ඇතුළත නුවර-දොඩංවල පිහිටි මහකුඹුර නමැති හා ගිරඹෙවත්ත ඉඩමේ කොටසක් වන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඉසෙඩ් ආබ්දීන් විසින් සාදන ලද 2004 අප්‍රේල් 26 දාතම හා අංක 400/1566/ELO28 දරන සාවයව පිඹුරේ ලොට් C (බලයලත් මිනින්දෝරු එම්. එස්. ආබ්දීන් විසින් සාදන ලද අංක 400 පිඹුරේ (ලොට් 1 සහ 2 වන) වශයෙන් ලකුණු කොට නිරූපිත උතුරට : කඳු වැටිය ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : කඳුවැටිය ද සහ බටහිරට : ඇළ ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් පහළොවක් (අ. 0, රූ. 2, පර්. 15) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ ඉඩම් කොටස එහි පිහිටි සෑම සියලු දේ සමහය.

ඉහත කී ලොට් C මතු දැක්වෙන ඉඩමේ ප්‍රතිමිනුමකි. ඒ කෙසේදයත්,

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ නාගරික කොට්ඨාස අංක 05 නුවර දොඩංවල පිහිටි මහකුඹුර ඉඩමේ කොටසක් නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ඉසෙඩ් ආබ්දීන් විසින් සාදන ලද 1990 ජනවාරි මස 06 දාතම හා අංක 400 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 සහ 02 වශයෙන් ලකුණු කොට දක්වා ඇති මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රුරුව A337/216 යටතේ ලියාපදිංචි කොට ඇති උතුරට : සීලවතී මැණිකේට අයත් මහකුඹුර ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : එච්. එම්. පුංචි මැණිකේට සහ සී. එම්. දොඩංවෙලට අයත් හත්දෙස්ස කුඹුර ද, සහ බටහිරට : ඇළද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් පහළොවක් (අ. 0, රූ. 2, පර්. 15) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස් ඒවායේ සෑම සියලු දේ සමහ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

02-347/3

---

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0007 5009 8533.

2006 ජූලි මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගොඩමුන්න, අරාව, අංක 166හි පදිංචි ඒකනායක මුදියන්සේලාගේ ධනන්ජය උදය බණ්ඩාර ඒකනායක යන අය බන්ධනදායී වශයෙන් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. විබැද්දෙ විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 පෙබරවාරි මස 17 දාතම හා අංක 524 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2006 පෙබරවාරි මස 01 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දසලක්ෂ හැත්තෑ එක් දහසක් (රු. 1,071,000) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දසලක්ෂ හැත්තෑඑක් දහසක (රු. 1,071,000) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දසලක්ෂ හැටදහසක (රු. 1,060,000) මුදල සඳහා වසරකට සියයට දාහතයි දශම පහ (17.5%) බැගින් 2006 පෙබරවාරි මස 02 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමහ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 524 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැදපළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉලුක්වත්තේ පිහිටි මාරලන්ගොඩවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. බී. ලංසකාරනායක විසින් සාදන ලද 1989 සැප්තැම්බර් මස 14 දාතම හා අංක 147 (2004 දෙසැම්බර් මස 22 වැනි දින තහවුරු කළ) දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට නිරූපිත, මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව 445/73 හි ලියාපදිංචි කළ ඊසාන දෙසින් : කොළඹ නුවර පාරේ සිට ලගමුව දක්වා දිවෙන පාර ද, ගිණිකොන දෙසින් : කාණුව හා එම ඉඩමේම ඉතිරි කොටස ද, නිරිතදිගින් : පංසල් වත්ත කන්ද ද සහ වයඹ දෙසින් : ජීවී වැට සහ මාරලන්ගොඩ වත්ත ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි සෑම සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

02-347/4

---

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0042 5000 4139.

2006 සැප්තැම්බර් මස 28 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 03, මුහන්දිරම් පාර, අංක 169හි මොහොමඩ් සනූන් මොහමඩ් යන අය බන්ධනදායී වශයෙන්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2004 සැප්තැම්බර් මස 23 දාතම හා අංක 178 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් එකී බැඳුම්කරය මත 2006 ජූලි මස 18 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහඅට ලක්ෂ හතලිස් පන්දහස් හාරසියයකුත් ශත හතලිස් හතක (රු. 1,845,400.47) මුදලක් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් දහඅට ලක්ෂ හතලිස් පන්දහස් හාරසියයකුත් ශත හතලිස් හතක (රු. 1,845,400.47) සම්පූර්ණ හිඟ මුදල සමඟ තවත් රුපියල් දාහත් ලක්ෂ පනස් එක් දහස් තුන්සිය හතලිස් පහකුත් ශත දහසයක (රු. 1,751,345.16) මුදල සඳහා වසරකට සියයට දහසය (16%) බැගින් 2006 ජූලි මස 19 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමඟ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 178 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ, කන්ද පල්ලේ කෝරළේ, ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගලේවෙල පිහිටි මාතලේ පාරේ, වරිපනම් අංක 45, 47 සහ 49 දරන මීගස්කොටුව සහ දලුපොත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ආර්. කනගරත්නම් විසින් සාදන ලද 2000 ජූනි මස 23 දාතම හා අංක 7017 දරන පිඹුරේ නිරූපිත ලොට් 3B1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති මාතලේ ඉඩම් කාර්යාලයේ D476/204හි ලියාපදිංචි කොට ඇති එකී අංක 7017 පිඹුරට අනුව, උතුරට : ජලීලා උම්මාගේ ඉඩම ද, නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ද, දකුණට : සම්සුන් නිසාගේ ඉඩම ද, සහ බටහිරට : (ගලේවෙල සිට මාතලේ දක්වා දිවෙන) මහා මාර්ගය ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දහඅටයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 18.35) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස, එහි පිහිටි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සමඟ සහ එයට අදාල සියළුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

02-347/6

---

සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1030 5006 8807.

2006 ඔක්තෝබර් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හලාවත, ඉනිගොඩවෙල, අංක 276හි පදිංචි වර්ණකුලසූරිය වික්ටර් ප්‍රනාන්දු සහ මැණික්රත්න කංකානම්ගේ මේරි ලාලනී ප්‍රනාන්දු යන දෙදෙනා බන්ධනදායින් වශයෙන් සහ ඉහත කී හලාවත ඉනිගොඩවෙල, අංක 276හි පදිංචි වර්ණකුලසූරිය වික්ටර් ප්‍රනාන්දු සහ මැණික්රත්න කංකානම්ගේ මේරි ලාලනී ප්‍රනාන්දු යන දෙදෙනා උකස්කරුවන් වශයෙන් ද, වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2005 සැප්තැම්බර් 06 දාතම හා අංක 27177 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2006 අගෝස්තු මස 01 වැනි දිනට රුපියල් දොළොස් ලක්ෂ හතලිස් හත්දහස් අටසිය හැත්තෑ දෙකකුත් ශත පනස් හතක් (රු. 1,247,872.57) ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දොළොස් ලක්ෂ හතලිස් හත් දහස් අටසිය හැත්තෑ දෙකකුත් ශත පනස් හතක (රු. 1,247,872.57) සම්පූර්ණ හිඟ මුදලක සමග තවත් රුපියල් එකොළොස් ලක්ෂ තිස්තුන් දහස් එකසිය තිස් හතරක (රු. 1,133,134) මුදල සඳහා වසරකට සියයට

දොළහයි දශම පහ (12.5%) බැගින් 2006 අගෝස්තු මස 02 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමඟ ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 27177 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ උතුරු පිටිගල් කෝරළේ, මුන්නේශ්වරම් පත්තුවේ, ඉනිගොඩවෙල පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1980 පෙබරවාරි මස 29 දාතම හා අංක 638/P දරන පිඹුරේ නිරූපිත කෝන්ගහ කොටුවේ ලොට් 28 නමැති උතුරට : එකී අංක 638/P පිඹුරේ ලොට් 27 ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 29 ද, දකුණට සහ බටහිරට : (ලොට් 99 පාර සඳහා වෙන් කළ කොටස වඩාත් නිවැරදිව බටහිරට : ලොට් 102) (පාර සඳහා වෙන්කළ කොටස) ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් දාහතක් (අ. 0, රූ. 0, පර්. 17) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස එහි පිහිටි සෑම සියළු දේ සමඟ සහ එයට අදාල අයිතීන් මාර්ග, වරප්‍රසාද සහ දාසත්ව පහසුකම් ද සියල්ල සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

02-347/5

---

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ණය අංක : 603080245040 - 603080245050 සහ 603060258504.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.11.17 දින පවත්වන ලද රැස්වීමේදී මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ(විශේෂ) විධි විධාන පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ නමට, ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එස්. ඒ. එම්. ඒ. සී. ජේ. එස්. කේ. සෙනවිරත්න සහ ආර්. එම්. ජී. බී. ජයසේකර විසින් ලියා සහතික කරන ලද අංක 2127 සහ 4721 හා 2003.04.08 සහ 2003.12.05 දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම උකස්කරු වන කොච්චිකඩේ, පාසැල් පටුමගේ, අංක 32/20 හි පදිංචි එල්ලප්පුලි ආරච්චිගේ දොන් ස්ටැන්ලි සිරිසේන මහතා විසින් පැහැර හැර ඇති හෙයින්ද, දැනට එකී උකස් බැඳුම්කර මත 2006.12.28 වන දිනට රුපියල් පහලොස් ලක්ෂ හතලිස් හය දහස් තුන්සිය හතලිහයි ශත අසූව (රු.1,546,340.80) ක මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පහලොස් ලක්ෂ හතලිස් හය දහස් තුන්සිය හතලිහයි ශත අසූව (රු.1,546,340.80) ක මුදල සහ 2006.12.28 දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා ඒ සඳහා සියයට දහහතර හා සියයට දොළහ (14% හා 12%) වන වාර්ෂික පොලියද, ප්‍රචාරක වියදම් ද, දරන ලද වෙනත් ගාස්තු ඇත්නම් එම ගාස්තු සහ සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල ද ඉන්පසුව, යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල්ද අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2127 සහ 4721 උකස් බැඳුම්කර මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත උකස්කර ඇති, මෙම උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය, ප්‍රසිද්ධ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව නගර සහා සීමා තුළ පල්ලන්සේන උතුර පිහිටි තක්සේරු අංක 26/19, පාසල් පටුමග දරන, ගොරකහ කුඹුර සහ කහටගහ කුඹුර, ගොරකහකුඹුර සහ මැටිවලකුඹුර සහ කහටගහකුඹුර, බණ්ඩාර කුඹුර සහ මැටිවල කුඹුර සහ බණ්ඩාර කුඹුර සහ බණ්ඩාරවත්ත වර්තමානයේ බණ්ඩාරවත්ත යනුවෙන් හඳුන්වන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. එම්. දසනායක විසින් මැන සාදන ලද 1996.10.11 දිනැති අංක 4052 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන පර්චස් 10 (අක්. 0, රූ. 0, පර්. 10)ක විශාලත්වයක් ඇති ලොට් අංක 20 නැමැති ඉඩමට මායිම් උතුරට : ලොට් අංක 19 ද, නැගෙනහිරට : අඩි 30 ක් පළල වෙන් කළ බිම් කොටස ද, දකුණට : ලොට් අංක 21 සහ බටහිරට : අඩි 15 ක් පළල මාර්ගය ද, යන මායිම් ඇතුළත පිහිටි ඉඩම සහ එහි පිහිටි සියලු දේ මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ඊ 815/213 යටතේ ලියාපදිංචි වී ඇති අතර, ගොනු ඊ 913/146 යටතේ අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ඉහත කී අංක 4052 දරන පිඹුරේ දැක්වෙන මාර්ගය සඳහා වෙන් කළ බිම් කොටස මත ගමන් කිරීමේ අයිතිය ද සමග.

සහකාර සාමාන්‍යාධිකාරී (ණය),

ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංක 011-2576132

02-247

---

## රුහුණ සංවර්ධන බැංකුව - ඇල්පිටිය ශාඛාව

### 1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශේෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2006.09.26 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන මහතා විසින් සහතික කරන ලද 2005.06.26

දිනැති අංක 994 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඇත්කඳුර, දැඩිවිල, බෝධිය අසල, යන ලිපිනයේ පදිංචි පෙමත්තුහේවාගෙයි ලිසිනෝනා සහ වන්නිපුර ධර්මසිරි සෙනවිරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැත්තෑහයදහසක (රු. 376,000) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2005.12.30 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් තුන්ලක්ෂ හැත්තෑහයදහසක (රු. 3,76,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 994 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙනිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, පොල්ගහවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොල්ගහවිල ගමේ පිහිටි, සර්වේ ජනරාල්ගේ පී. වී. පී. 606 දරන පිඹුරේ නිරූපිත කොස්ගහවෙලකන්ද බෙදූ ලොට් 10ඊ නැමති, උතුරට : මෙම සැළැස්මේ ලොට් 10 සහ 10 ඩී ද, නැගෙනහිරට : සැළැස්මේ ලොට් ඩී සහ එෆ් ද, දකුණට : මෙම සැළැස්ම ලොට් 10 එෆ් හා 19 ද, බස්නාහිරට : මෙම සැළැස්මේ ලොට් 16,17 සහ 19 ද යන මායිම් වන රූඩ් දෙකයි පර්චස් හය ( අක්. 00 රූඩ්. 02 පර්. 06) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි, නිවාස ආදී සියලු දේද වේ.

මෙම දේපල බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2005.07.05 දින අංක A/2/48 වංචල 10/192 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරි,
ටී. ජී. විමලරත්න

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන,
මාතර.

02-187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.